# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2342/04 – 2023 ජූලි මස 24 වැනි සඳුදා – 2023.07.24**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය: IR/COM/05/2016/135.

**කාර්මික ආරාවුල් පනත - 131 වන අධිකාරය**

131 වන අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ 2018.09.17 දිනැති හා අංක 2089/15 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2018.08.29 දින දරන නියෝගයෙන්, එක් පාර්ශ්වයක් වශයෙන් පිලවල, හීනටිකුඹුර, අංක 39 හි පදිංචි කේ. එම්. ඩබ්. බී. කවිසේකර මයා සහ කොළඹ 05, කිරුළ පාර, අංක 200 හි පිහිටි ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම්කිරීමෙන් සමථයකට පත්කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති 2023.06.05 දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

**බී. කේ. ප්‍රභාත් චන්ද්‍රකීර්ති,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2023 ජූලි මස 12 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.

බේරුම් කිරීමේ අංශය හා කාර්මික අධිකරණය

නඩු අංකය - A/65/2018.
IR/COM/05/2016/135.

කේ. එම්. ඩබ්. බී. කවිසේකර,
අංක 39, හීනටි කුඹුර,
පිලවල,

*සහ*

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය,
අංක 200, කිරුළ පාර,
කොළඹ 05.

අතර ඇති කාර්මික ආරාවුල

**ප්‍රදානයයි**

කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය රවීන්ද්‍ර සමරවීර මහතා විසින් 1957 අංක 14 සහ 1957 අංක 62 සහ 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන ) පනත සමග කියවා) දරන පනත් වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණ පනත් වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් පැවරි ඇති බලතල අනුව ඉහත නම් සඳහන් පාර්ශ්වයන් අතර වූ කාර්මික ආරාවුල බේරුම්කිරීමෙන් නිරවුල් කිරීම සඳහා 2018.08.29 වැනි දින බේරුම්කරු වශයෙන් මා පත් කරන ලදී.

කම්කරු කොමසාරිස් ජනරාල් විසින් ගොණු කරන ලද 2018.08.16 වැනි දින අංක IR/COM/05/2016/135 දරන ලේඛනය අනුව ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ඇති කාර්මික ආරාවුලට හේතුවී පවත්නා කරුණු වන්නේ,

"ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලයේ සේවකයෙකු වූ කේ. එම්. ඩබ්. බී. කවිසේකර මහතාට 2004.02.01 දින සිට ලබා දුන් වේතන වර්ධක 03 ක් 2004 මැයි මාසයේ සිට අහිමි කිරීම හා ඊට අදාළ ව්‍යවස්ථාපිත හිමිකම් අහිමි කිරීම යුක්ති සහගත ද ? එසේ නොවේ නම් ඒ මහතාට හිමිවිය යුතු සහනයන් මොනවාද යන්න පිළිබඳව වේ."

විස්තර ප්‍රකාශ ඉදිරිපත් කරමින් ඉල්ලුම්කරු සඳහන් කර ඇත්තේ දෙවන පාර්ශ්වය විසින් 2004.02.01 දින සිට තමා වෙත ලබා දුන් වැටුප් වර්ධක 03, 2004 මැයි මාසයේ සිට අහිමි කිරීම හා ව්‍යවස්ථාපිත හිමිකම් අහිමි කිරීම මගින් අසාධාරණයක් සිදු වූ බවය. දෙවන පාර්ශ්වය විස්තර ප්‍රකාශ ඉදිරිපත් කරමින් ඉල්ලා සිටින ලද්දේ එකී වැටුප් වර්ධක නතර කිරීම පිළිබඳව කරුණු දක්වමින් ඉල්ලුම්කරුගේ ඉල්ලීම නිශ්ප්‍රභා කරන ලෙසය.

2019.02.08 දින මෙම ආරාවුල විමසීමට ගත් අවස්ථාවේදී ඉල්ලුම්කරු ද දෙවන පාර්ශ්වය වෙනුවෙන් නීති නිලධාරිනි නිමේෂා විතානගේ මහත්මිය ද, රජයේ නීතිඥ තාරකා කෝදාගොඩ මහත්මිය ද පෙනී සිටි අතර මෙම ආරාවුල බේරුම්කිරීමෙන් සමථයක් ඇති කර ගැනීමට හැකියාවක් තිබේද යන්න දෙපාර්ශ්වයෙන් විමසා සිටියෙමි. ඉල්ලුම්කරු ප්‍රකාශ කරන ලද්දේ 2004.05.01 දින සිට 2009.05.06 දින දක්වා අහිමි කරන ලද වේතන වර්ධක 3හි හිඟ මුදල හා පාරිතෝෂික වෙනුවෙන් රුපියල් 49,282/- ක මුදලක් ලබා දෙන්නේ නම් තමා සෑහීමකට පත් වන බවය. ඉල්ලුම්කරු විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව සලකා බැලීම සඳහා දෙවන පාර්ශ්වයට දින ලබා දෙන ලද අතර 2019.06.07 වැනි දින ශ්‍රී ලංගම සභාපති ලිපියක් ඉදිරිපත් කරමින් සඳහන් කරන ලද්දේ මෙම ආරාවුල පිළිබඳ සමථයක් නොමැති බවය.

ඒ අනුව 2019.08.11 දින මෙම ආරාවුල විමසීමට ගන්නා ලදී. එදින ඉල්ලුම්කරු ද ඔහු වෙනුවෙන් නියෝජිත එම්. ඒ. දයාරත්න මහතා ද, දෙවන පාර්ශ්වය වෙනුවෙන් රජයේ නීතිඥ තාරකා කෝදාගොඩ මහත්මිය ද පෙනී සිටියහ. එදින ඉල්ලුම්කරු සාක්ෂි දීම ආරම්භ කරන ලද අතර 2021.01.19 දින සාක්ෂි ලබා දී මූලික සාක්ෂි අවසන් කරන ලදී. ඉල්ලුම්කරු සිය සාක්ෂිය ලබා දීමේදී A1 සිට A14 දක්වා වූ ලේඛන ද ලකුණු කරන ලදී. ඉල්ලුම්කරු සිය සාක්ෂියේදී සඳහන් කරන ලද්දේ වැඩි කරන ලද වේතන වර්ධක 2004 පෙබරවාරි, මාර්තු, අප්‍රේල් මාස වල ගෙවන ලද බවත් 2004 මැයි මාසයේ සිට එය නතර කළ බවත් ය. ඉල්ලුම්කරු වැඩි දුරටත් ප්‍රකාශ කර සිටියේ ඒ පිළිබඳ මුදල් කළමනාකරුගෙන් විමසා සිටි විට ඔහු ප්‍රකාශ කරන ලද්දේ කළමනාකාර අධ්‍යක්ෂක විසින් දෙන ලද උපදෙස් අනුව එසේ කළ බවය.

තමාගේ වැටුප් වර්ධක නතර කරන ලද අවස්ථාවේ තවත් සේවකයින් කීප දෙනෙකුගේ ද වැටුප් වර්ධක නතර කරන ලද බව ඉල්ලුම්කරු ප්‍රකාශ කලේය. ඉල්ලුම්කරුට වැටුප් වර්ධක 3ක් අනුමත කරමින් ලබා දුන් ලිපිය A5 ලෙස ද, විමලසේන නමැති සේවකයෙකුගේ අදාළ වැටුප් වැඩිවීම ගෙවීමට කටයුතු කරන ලෙස 2004.09.14 දින මහනුවර සහකාර කම්කරු කොමසාරිස් විසින් මහනුවර බස් සමාග මට දන්වා සිටින ලද ලිපියක් A6 ලෙස ද, ඉල්ලුම්කරු 2014.03.01 වැනි දින මහනුවර කම්කරු කාර්යාලයට යවන ලද ලිපියක් A8 ලෙස ද, එම ඉල්ලීම සම්බන්ධයෙන් කරන ලද පරීක්ෂණ සඳහා කැඳවන ලද ලිපි A9ඒ, A9බී, A9සී, A9ඩී ලෙස සළකුණු කර ඉදිරිපත් කරන ලදී. එසේම ශ්‍රී ලංගම මහනුවර ප්‍රාදේශීය කළමනාකරු ප්‍රධාන නීති නිලධාරි වෙත යවන ලද ලිපියක් A10 ලෙස ද, ශ්‍රී ලංගම ප්‍රාදේශීය මුදල් කළමනාකරු නියෝජ්‍ය කම්කරු කොමසාරිස් වෙත යවන ලද ලිපියක් A11 ලෙස ද, ආනන්ද නැමති සේවකයෙකු සම්බන්ධයෙන් කාර්මික අධිකරණයේදී ඇති කරගන්න සමථයකට අදාළ ලිපියක් A12 ලෙස ද සළකුනු කරන ලදී. 2021.01.27 වැනි දින

දෙවන පාර්ශ්වය ඉල්ලුම්කරුගෙන් හරස් ප්‍රශ්න ඇසීම ආරම්භ කළ අතර හරස් ප්‍රශ්න වලට පිළිතුරු දෙමින් ඉල්ලුම්කරු ප්‍රකාශ කළේ වැටුප් වර්ධක නතර කිරීම සම්බන්ධයෙන් වාචික පැමිණිල්ලක් පමණක් කළ බවය. 2004 වර්ෂයෙන් පසු තමාට උසස් වීම් ලැබුන බවත් 2009.05.06 වැනි දින විශ්‍රාම ගිය බවත්, විශ්‍රාම යන තෙක්ම වැටුප් වර්ධක නතර කිරීම සම්බන්ධයෙන් කිසිදු ක්‍රියාමාර්ගයක් නොගත් බවත් ඉල්ලුම්කරු පිළිගත්තේය. ඒ සම්බන්ධයෙන් යම්කිසි ක්‍රියා මාර්ගයක් ගන්නා ලද්දේ විශ්‍රාම ගොස් වසර 5 කට පසු 2014 වර්ෂයේ දී බව ද හරස් ප්‍රශ්න වලට පිළිතුරු දෙමින් ඉල්ලුම්කරු ප්‍රකාශ කළේය. ඉල්ලුම්කරු සිය මූලික සාක්ෂියේදී A7 ලෙස ලකුණු කරන ලද *ගැසට් පත්‍රය* වැටුප් වර්ධක වලට අදාළ ලේඛනය නොවන බව දෙවන පාර්ශ්වය කරන ලද යෝජනාව ද ඉල්ලුම්කරු පිළිගත්තේය.

ඉල්ලුම්කරු විශ්‍රාම යාමෙන් පසු පාරිතෝශිත මුදල් හා අර්ථසාධක මුදල් ලබා ගත් බවත් මෙම ඉල්ලීම කරන්නේ ඉන් පසුව බවත් සිය සාක්ෂියේදී පිළිගත්තේය.

දෙවන පාර්ශ්වය විසින් ඉල්ලුම්කරුගෙන් කරන ලද යෝජනා වලට පිළිතුරු ලබා දුන්නේ මෙසේය. (2021.01.27 දින සාක්ෂි සටහන් 22-23 පිටු)

ප්‍රः ඉල්ලුම්කරු අවසාන වශයෙන් යෝජනා කරනවා ඉල්ලුම්කරු මෙම ගරු අධිකරණයට ඔබට හිමි විය යුතු යැයි කියන වැටුප් වර්ධකය සම්බන්ධයෙන් ඉදිරියට කටයුතු නොකළේ ඉල්ලුම්කරුට වාසි සහගත වන ආකාරයෙන් පාරිතෝෂිත මුදල් හා අර්ථ සාධක මුදල ලබා ගැනීමට චේතනාවක් තිබූ බව හේතුවෙන්. මහත්මයා එය පිළිගන්නවද?

පිः පිළිගන්නවා.

ප්‍රः මහත්මයා අවසාන වශයෙන් ලකුණු කරන ලද A7 *ගැසට් නිවේදනයේ* මහත්මයාගේ වැටුප් වර්ධකය අදාළ නොවන *ගැසට් නිවේදනයක්* බව පිළිගන්නවාද?

පිः ඔව්

ඉල්ලුම්කරු වෙනුවෙන් සාක්ෂි කැඳවීම අවසන් වීමෙන් පසු 2 වන පාර්ශ්වය වෙනුවෙන් 2022.11.04 ප්‍රාදේශීය මුදල් කළමනාකාරිනිය ශ්‍රියා කුමාරි තෙන්නකෝන් මහත්මිය සාක්ෂියට කැඳවන ලදී. සාක්ෂිකාරිය සඳහන් කළේ 2004.02.01 දින සිට ඉල්ලුම්කරු ඇතුළු සේවකයින්ට වේතන වර්ධක තුනක් ලබා දී ඇති බවත් එය අනුමත කර ඇත්තේ සේවක මණ්ඩල කළමනාකරු බවත් සඳහන් කළේය. වේතන වර්ධක ලබා දීම, වේතන වර්ධක අත් හිටුවීම, සේවයේ ප්‍රතිස්ථාපනය කිරීම, ආදී බලතල හිමිවන්නේ සේවක මණ්ඩල කළමනාකරුට බව සඳහන් කළ සාක්ෂිකාරිය වැටුප් වර්ධක වැඩි කිරීමේ ලේඛනය R1 ලෙසත්, සේවක චාර්ය සටහන් R2 ලෙසත්, ලකුණු කර ඉදිරිපත් කරන ලදී. එසේම සේවක මණ්ඩල කළමනාකරු විසින් 2004.05.07 වැනි දින සිට වැටුප් වර්ධක අත්හිටුවීමේ ලේඛනය R3 ලෙස ලකුණු කර ඉදිරිපත් කළේය. එම වැටුප් වර්ධක අත්හිටුවීම ඉල්ලුම්කරු ඇතුළු එම වර්ධක හිමි වූ අනෙකුත් සේවකයින්ටද අදාළව සිදු වූ බවත් එම වසරේ දෙසැම්බර් මාසයේ සිට වැටුප් වර්ධක තුන නැවත ගෙවන ලද බවත් සාක්ෂිකාරිය ප්‍රකාශ කළේය.

ඉල්ලුම්කරු වෙනුවෙන් එම සාක්ෂිකාරියගෙන් හරස් ප්‍රශ්න අසමින් ශ්‍රී ලංගම විනය ව්‍යවස්ථා මාලාව A13 ලෙසත්, එම ව්‍යවස්ථා මාලවේ 10(1) වගන්තිය A13ඒ ලෙසත් ලකුණු කරමින් වේතන හෝ ශ්‍රේණි පහළ දැමීම විනය විභාගයකින් පසුව කළ යුතු දෙයක් බවට යෝජනා කළේය. ඊට පිළිතුරු දෙමින් සාක්ෂිකාරිය ප්‍රකාශ කළේ එය සාමාන්‍ය වේතන වලට අදාළ වුවත් වේතන වර්ධක වලට අදාළ නොවන බවයි. නැවත ප්‍රශ්න වලට පිළිතුරු දෙමින් සාක්ෂිකාරිය සඳහන් කළේ ඉල්ලුම්කරුට ලබා දී ඇත්තේ විශේෂ වර්ධකයක් බවත් එය මහනුවර බස් සමාගමේ සියලුම සේවකයන්ට අදාළ වුවක් බවත්, විශේෂ වැටුප් වර්ධකවලට විනය පරීක්ෂණ ක්‍රියාදාමය අදාළ නොවන බවත්ය.

එම සාක්ෂිකාරියගෙන් හරස් ප්‍රශ්න අසන අවස්ථාවේදී ඉල්ලුම්කරු වෙනුවෙන් තවත් ලේඛන කිහිපයක් A13, A13A , A14, A14a, b, c, d, e, h ලෙස ලේඛනවල කොටස් ලකුණු කර ඉදිරිපත් කරන ලදී.

විශේෂයෙන් සඳහන් කළ යුතු කරුණක් වන්නේ සාක්ෂි විමසීමේදී ඉල්ලුම්කරු වෙනුවෙන් A1 සිට A12 වූ ලේඛනද , මුදල් කළමනාකාරියගෙන් හරස් ප්‍රශ්න අසන අවස්ථාවේදී A14, A14a, b, c, d, e, h ලකුණු කරන ලද ලේඛන ද, A5 ලේඛන ද ලකුණු කරන ලද නමුත් ඉල්ලුම්කරු වෙනුවෙන් ඉදිරිපත් කරන ලද ලිඛිත දේශනය සමග හෝ ඉන් පෙර එම ලේඛන මෙම නඩුවට ඉදිරිපත් කර නොමැති බවයි. ඒ අනුව වේතන වර්ධක අත් හිටුවීමෙන් ඉල්ලුම්කරුට අසාධාරණයක් සිදු වූයේ ද යන්න සළකා බැලීමට අවශ්‍ය ලේඛන ඉදිරිපත් නොකර ඒ පිළිබඳ සහනය ලබා දිය නොහැකි බව ප්‍රකාශ කරමි. තවද ඉල්ලුම්කරු වෙනුවෙන් X වශයෙන් ලේඛනයක් පිළිබඳව සඳහන් කළ ද එවැනි ලේඛනයක් සාක්ෂි විභාග වලදී ඉදිරිපත් නොවීය.

වැටුප් වර්ධක නතර කිරීම පිළිබඳව ඉල්ලුම්කරු විශ්‍රාම යන තුරුත්, විශ්‍රාම ගොස් වසර කිහිපයක් ගතවන තුරුත් කිසිදු ක්‍රියා මාර්ගයක් නොගැනීම පිළිබඳවත් ඉල්ලුම්කරු ලකුණු කරන ලද ඇතැම් ලේඛන මෙම කරුණට අදාළ නොවන බව ඉල්ලුම්කරු විසින්ම පිළිගැනීමත් 2004 දෙසැම්බර් මාසයේ සිට වැටුප් වර්ධක නැවත ලබා දීමත් යන කරුණු සැලකිල්ලට ගතිමි. එසේම වැටුප් වර්ධක

නතර කිරීම ගැන දෙවන පාර්ශ්වය ඉදිරිපත් කරන ලද කරුණු පිළිබඳව සැහීමකට පත් වෙමි.එසේම එම පාර්ශ්වය ලකුණු කරන ලද R1 සිට R5 දක්වා ලේඛන ද, ලිඛිත දේශනය සමඟ ගොනු කර ඇත. වැටුප් වර්ධක නතර කිරීම නිසා අසාධාරණයක් සිදු වූ බව තහවුරු කිරීමට ඉල්ලුම්කාර පාර්ශ්වය අසමත් වී ඇති බව තීරණය කරමි. ඒ අනුව ඉල්ලුම්කරුගේ ඉල්ලීම නිශ්ප්‍රභා කරමි. මෙම ප්‍රදානය සාධාරණ හා යුක්ති සහගත තීරණයක් බවද ප්‍රකාශ කරමි.

නීතිඥ සරත් ලියන්ගේ,
බේරුම්කරු.

2023 ක් වූ ජුනි මස 05 වැනි දින දී ය.

EOG 07 – 0218

---

මගේ අංකය: IR/COM/02/2020/106.

## කාර්මික ආරාවුල් පනත - 131 වන අධිකාරය

131 වන අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ 2022.11.19 දිනැති හා අංක 2306/87 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2022.11.14 දින දරන නියෝගයෙන්, එක් පාර්ශ්වයක් වශයෙන් මාතර, අකුරැස්ස, උරුමුත්ත, මිනුවන්විලවත්ත හි පදිංචි ආර්. ඉන්දික ප්‍රසාද් මයා සහ කොළඹ 02, ශ්‍රීමත් චිත්තම්පලම් ඒ. ගාඩිනර් මාවත, අංක 34 හි පිහිටි ජාතික නිවාස සංවර්ධන අධිකාරිය අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම්කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති 2023.06.28 දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

**බී. කේ. ප්‍රභාත් චන්ද්‍රකීර්ති,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2023 ජූලි මස 12 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.

බේරුම්කරණ අංශය හා කාර්මික අධිකරණයේ දී ය

බේරුම්කරණ නඩු අංකය - ඒ/77/2022.
IR/COM/02/2020/106.

ආර්. ඉන්දික ප්‍රසාද් මයා,
මිනුවන්විලවත්ත,
උරුමුත්ත,
අකුරැස්ස,
මාතර.

*පළමු පාර්ශ්වය*

ජාතික නිවාස සංවර්ධන අධිකාරිය,
34, ශ්‍රීමත් චිත්තම්පලම්,
ඒ ගාඩිනර් මාවත,
කොළඹ 02.

*දෙවන පාර්ශ්වය*

**ප්‍රදානය**

කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය මනූෂ නානායක්කාර මහතා විසින්, 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 04 හා (1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමඟ කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය 1956 ප්‍රතිශෝධිත පනතේ 4(1) වන වගන්තිය ප්‍රකාරව බේරුම් කිරීමෙන් නිරවුල් කිරීමට මා පත් කර ඇත,

මෙම ආරාවුල ලෙස කොළඹ කම්කරු කොමසාරිස් ජනරාල් තැන මා වෙත යොමු කර ඇත්තේ.

"ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ සේවය කරන ආර්. ඉන්දික ප්‍රසාද් මහතාට 2010 බඳවා ගැනීමේ පටිපාටියට අනුව MM 1-1 සේවා ශ්‍රේණියට අනුව උසස්වීම් ලබාදීමේ දී අසාධාරණයක් සිදුවී ඇද්ද එසේ අසාධාරණයක් සිදුවී ඇත්නම් ඒ මහතාට ලැබිය යුතු සහනයන් පිළිබඳව" වේ.

මෙම නඩුව 2023.04.03 දින විභාගයට ගත් අවස්ථාවේ ඉල්ලුම්කරු ඉදිරිපත් කළ කරුණු සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණයේ මූලික අයිතිවාසිකම් නඩුවක් ගොනුකර ඇති බැවින් බේරුම්කරණය ඉදිරියේ ඇති ඉල්ලීම් ඉල්ලා අස්කර ගන්නා බව ඉල්ලුම්කරු ප්‍රකාශ කරන ලදි.

ඒ අනුව බේරුම්කරණ මණ්ඩලයේ නඩු කටයුතු අවසන් කරන බවට ප්‍රදානය නිකුත් කරමි. මෙය සධාරණය හා යුක්ති සහගත ප්‍රදානයක් බව තීරණය කරමි.

බේරුම්කරු.

2023 ක් වූ ජුනි මස 28 වැනි දින දී ය.

EOG 07 – 0219